ලේකම්,

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ විශේෂඥ කමිටුව

කාමර අංක 32,

බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,

කොළඹ 7

**නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් අපගේ ස්ථාවරය පැහැදිලි කරමින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

## පසුබිම

වසර 2500 ක ට වඩා අතීතයකට දිව යන අප ඉතිහාසය පුරා පැවැති රාජ්‍ය ක්‍රමය තුල පැවැතියේ ජනතාව, රාජ්‍ය නායකයා හා භිකෂුන් වහන්සේ යන ත්‍රිත්වය සක්‍රිය මෙන්ම අඛන්ඩ චක්‍රිය යාන්ත්‍රණයක පිහිටුවන ලද පාලන ක්‍රමයකි. එහි දි රාජ්‍ය නායකයා ප්‍රමුඛ රජය විසින් ජනතාව වෙත ඉටුකල යුතු යුතුකම් ජනතා අපේක්ෂාවන් සංතෘප්තමත් වන ආකාරයෙන් ඉටු කිරීමට බැඳී සිටින ලදි. ඒ සඳහා භික්ෂුන් වහන්සේ විසින් ජනතාවත් ආණ්ඩුවත් අතර ශක්තිමත් හා අඛන්ඩ අන්තර් සම්බන්ධීකරණයක් සිදු කල අතර භික්ෂුන් වහන්සේ පෙරකි රාජ්‍ය යුතුකම හා වගකීම ඉටු කර වීමේ ගාමක බලවේගයක් ලෙස ක්‍රියාත්මක විය. එබැවින් ජනතාවත් රාජ්‍ය පාලකයත් අතර පැවැති **සමාජ ගිවිසුම** බන්ධනය නොවූ අතර එසේ වූ අවස්ථාවන් හි දි රාජ්‍ය නායකයාව නිවැරදි කරවීමට හෝ රාජ්‍ය නායකයා වෙත ලබා දී තිබූ අනුමැතිය අහෝසි කිරීමට නීතිමය බලයක් භික්ෂුන් වහන්සේ ට තිබුණි.

බටහිරින් ආනයනය කොට ආදේශ කරන ලද (අපට ආගන්තුක වූ) ඊනියා වත්මන් ව්‍යවස්ථා ආකෘතින් තුල රාජ්‍ය පාලකයා විසින් ජනතාවගේ අපේක්ෂාවන්ට එරෙහිව කටයුතු කරනු ලබන අවස්ථාවල දි රාජ්‍ය නායකයා හා ආණ්ඩුව වෙත ජනතා අපේක්ෂාවන් හා අවශ්‍යතාවන් ඉටුකරන ලෙස බල කර සිටීමේ ව්‍යවස්ථාමය ක්‍රියාදාමයක් නොමැත. එහිදි ආණ්ඩුව විසින් ජනතාව සමග ඇතිකරගෙන තිබෙන ව්‍යවස්ථාමය ගිවිසුම කඩ කල අවස්ථාවන්හි දි එම ගිවිසුම ක්‍රියාත්මක කරවා ගැනීමේ හැකියාවක් ජනාතාවට නොමැත. එබැවින් මෙරට ජනතාවගේ සිතුම් පැතුම් අනුව බලාත්මක විය යුතු ස්වතන්ත්‍රි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කළ යුතු වන්නේ වසර දහස් ගණනක් තිස්සේ අප රටේ පැවැති ආණ්ඩුක්‍රම හා පරිපාලන මූලධර්ම හා ප්‍රතිපත්තින් වත්මන් සමාජ තත්වයන්ට ගැලපෙන ආකාරයට හැඩගස්වා ගැනීමෙන් බව සඳහන් කර සිටිමු. බුදුදහමින් පෝෂණය වූ ජාතික ආණ්ඩුක්‍රමයේ මූලිකාංග අතර විශේෂ වූයේ අයිතිවාසිකම් නොව යුතුකම් හා සමාජ වගකීම් ප්‍රමුඛ

කොටගත් ක්‍රමවේදයකි. එහිදී රාජ්‍යනායකයා රටේත්, ජනතාවගේත්, ස්වභාධර්මයේත් භාරකාරයා පමණක් වූ අතර රාජ්‍යනායකයා ඇතුළු පාලකයින් තම ක්‍රියාවන් සම්බන්ධයෙන් ජනතාව වෙත වගවීමට හා වගකීමට බැඳී සිටින ලදි.

මෙහි පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරනු ලබන්නේ පෙර සඳහන් දේශීය ආණ්ඩුක්‍රම මූලධර්ම අන්තර්ගත වූ ශ්‍රී ලංකාවටම ආවේනික වූ ස්වතන්ත්‍ර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වත්මන් ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ එතුමා විසින් ප්‍රතිඥා දී ඇති පරිදි සම්පාදනය වෙතැයි යන දැඩි විශ්වාසයෙනි. මෙම යෝජනා ඉතාම සංක්ෂිප්තව හා මූලික කාරණාවලට අදාලව පමණක් ඉදිරිපත් කරනු ලබන බවද සඳහන් කර සිටිමු. මෙම කාරණා සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාචික කරුණු දැක්වීමක් ද ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙතැයි බලාපොරොත්තු වෙමු.

## <u>යෝජනා</u>

### <u>රාජ්‍ය ව්‍යුහය</u>

1 වන ව්‍යවස්ථාව

දැනට බාවිතා වන ඉංග්‍රිසි ව්‍යවස්ථාවේ ශ්‍රී ලංකාව **<u>සිලෝන්</u>** යන නාමයෙන් ද හඳුන්වා තිබේ.

Article 1

Sri Lanka **(Ceylon)** is a Free, Sovereign, Independent and Democratic Socialist Republic and shall be known as the Democratic Socialist Republic of Sri Lanka.

දැනට පිළිගෙන තිබෙන සිලෝන් යන වචනයේ මූලය වන්නේ සිහලදිප හා හෙලදිව යන වචනයි (Ceylon>Zielan>Serandip>**Sihaladipa**>**Heladiva**) එබැවින් සිංහල පිටපතට ද දෙමළ පිටපතටද රටේ නම ලෙස සිහලදිප යන්න ඇතුලත් කරන මෙන් යෝජනා කර සිටිමු.

යෝජිත 1 වන ව්‍යවස්ථාව

ශ්‍රී ලංකාව **(සිහලදිප)** නිදහස්, ද්වෛරී, ස්වාධීන, ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයකි. ශ්‍රී ලංකාව **(සිහලදිප)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යනුවෙන් හඳුන්වනු ලැබේ.

(ඉංග්‍රිසි වගන්තිය සිංහලට පෙරලිමේදී වාක්‍ය දෙකකට වෙන් කර දක්වා තිබේ).

**ඒකීය රාජ්‍ය හා රාජ්‍ය ආරක්ෂාව (2 වන ව්‍යවස්ථාව)**

ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ව පැවතිය යුතු ය. ඒකීය රාජ්‍යයට පටහැනිවන ආකාරයේ සියලු අනපනත් අවලංගු වුවා සේ සැලකිය යුතු බවට ව්‍යවස්ථාවෙන් ම පැනවිය යුතුය.

ඒකීය රාජ්‍යය මූලධර්මයට එරෙව හෝ පටහැනිව කටයුතු කරනු ලබන සියලු අය වරදකට වරදකරු විය යුතු ය. දැනට තිබන 6 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ගෙන එන ලද 157අ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ඒකීය රාජ්‍ය ද ආවරණය වන පරිදි තවදුරටත් ශක්තිමත් කළ යුතු ය.

මෙහි පහත සඳහන් ක්‍රියාවන් නීතිය මගින් දැඩි දඬුවම් පැමිණිවිය හැකි බරපතල වරද බවට පත් කළ යුතු ය (157අ වගන්තියට අදාල සංශෝධන ගෙන ආ යුතුය)

(අ) දේශියව හෝ ජාත්‍යන්තරව ඒකීය රාජ්‍ය අහෝසි කිරීමට හෝ ඒකීය රාජ්‍යයේ ව්‍යුහය වෙනස් කිරීමට සෘජුව හෝ වක්‍රව ක්‍රියා කිරීම

(ආ) ජාතිවාදී හෝ වෙනයම් පදනමක් මත රටේ වෙනම ප්‍රදේශයක වෙනම ජනවර්ග සිටින බවට හුවා දක්වමින් භූමිය වෙන් කිරීමට හෝ රට තුල වෙනම පාලන ප්‍රදේශ ඉල්ලමින් සෘජුව හෝ වක්‍රව ක්‍රියා කිරීම

(ඇ) දේශය තුල වෙනම රජයක් ඇති කිරීමට ක්‍රියා කිරීම ඇතුළුව දේශයේ භෞමික අඛණ්ඩතාවයට හානිවන ක්‍රියා කිරීම

එම ව්‍යවස්ථාවේ පනවා තිබෙන දඬුවම් වලට **ප්‍රජා අයිතිය අහෝසි කිරීම** ද දඬුවමක් ලෙස ඇතුලත් කිරීමද යෝජනා කර සිටියි.

**පරමාධිපත්‍ය බලය (3 වන ව්‍යවස්ථාව)**

ජනතාව සතු පරාමාධිපත්‍ය බලය පාවිච්චි කිරීමේ දි සෑම පුරවැසියෙකු ම රටත් ජනතාවත් වෙනුවෙන් ඉටු කිරීමට බැඳී සිටින සියලූ යුතුකම් හා වගකීම් ඉටු කිරීමට බැඳී සිටිය යුතු බවට ව්‍යවස්ථාවෙන් නියම කළ යුතු ය. ඊට ආනුශාංගික සංශෝධන 4 වන ව්‍යවස්ථාවට ද ඇතුලත් කරන ලෙස යෝජනා කර සිටියි

ජනතාවගේ පරමාධිපත්‍ය බලයට ශ්‍රී ලංකා දේශ සීමාවට යටත් සියලූම භූමිය, දේශීය ජල තීරය, ඉන් එපිට පිහිටි සමුද්‍ර ආර්ථික කලාපය, ජාත්‍යන්තර නීතියට අනුව ශ්‍රී ලංකාවට අයත් අහස ද එම සියලු තැන්හි පිහිටි රාජ්‍ය දේපළ, ස්වභාවික සම්පත් හා පරිසර සම්පත් ද යටත් විය යුතු බවට පැනවිය යුතුය.

**දේශ සීමාව (5 වන ව්‍යවස්ථාව)**

ශ්‍රී ලංකාවේ දේශ සීමාවට දේශිය ජල තීරයෙන් සීමා වන දිස්ත්‍රික්ක වලට පමණක් සීමා කිරීම වෙනුවට ජනතාවගේ පරමාධිපත්‍ය බලය බලාත්මක වන වපසරිය වන ශ්‍රී ලංකාවට අයත් සියලුම භූමිය, දේශිය ජල තිරය, ඉන් එපිට පිහිටි සමුද්‍ර ආර්ථික කලාපය හා එහි පිහිටි දූපත් ද, ජාත්‍යන්තර නීතියට අනුව ශ්‍රී ලංකාවට අයත් අහස හා අභ්‍යවකාශයේ ඇති චන්ද්‍රිකා රැඳවුම් ස්ථානද ඇතුලත් වන පරිදි ව්‍යාප්ත කරන ලෙසට යෝජනා කර සිටිමු.

**ජාතික ගීය (7 වන වගන්තිය)**

ජාතික ගීය ශ්‍රී ලංකා මාතා ගීය පමණක් වන බවට නියම කළ යුතු අතර එහි පරිවර්ථන ජාතික ගීය ලෙස සැලකීමත්, එවැනි පරිවර්තන ජාතික ගීය වෙනුවට ගායනා කිරීමත් තහනම් කළ යුතුය.

**බුද්ධ ශාසනය හා බුද්ධාගම (9 වන වගන්තිය)**

දැනට ඇති **9 වන වගන්තිය ඒ ආකාරයෙන් ම තැබිය යුතු ය.**

ව්‍යවස්ථාව මගින් 9 වන වගන්තියට බලාත්මක බාවයක් ලබා දිය යුතු ය- ඒ සඳහා මෙහි පහත යෝජනා ඉදිරිපත් කර සිටියි

(අ) බුද්ධ ශාසනය නිර්වචනය කිරීම (2002 බුද්ධ ශාසන ජනාධිපති කොමිෂන් සභාව විසින් යෝජිත නිර්වචනය- එයට බෞද්ධ ඉතිහාසයට හා සංස්කෘතියට සම්බන්ධ පුරා වස්තූන් යන්න එකතු කර ඇත)

> **තථාගතයන් වහන්සේ, නවලෝකෝත්තර ධර්මය, පර්යාප්ති ධර්මය, සංඝරත්නය, විහාරාංග සහිත විහාරස්ථාන, ආරණ්‍ය සේනාසන හා භාවනා මධ්‍යස්ථාන, බෝධි වෘක්ෂ, ස්තූප, සෙල් ලිපි, පිළිමගෙවල්, ධාතු මන්දිර, බණ පොත් හා පුස්තකාල, උපෝසථාගාර, විහාරස්ථාන සන්තක කෙත්වතු හා දේපොල, බෞද්ධ අධ්‍යාපනය, දේවාලය, සිල්මාතාවන් හා උපාසිකාරාම, තෙරුවන් සරණ ගිය ගිහි ජනතාව, බෞද්ධ සාහිත්‍යය, සංස්කෘතිය හා ශිෂ්ටාචාරය, බෞද්ධ ඉතිහාසයට හා සංස්කෘතියට සම්බන්ධ පුරා වස්තූන් බෞද්ධාගමික උත්සව, පෙරහැර හා පුද සිරිත්, බෞද්ධ ප්‍රතිපත්ති හා ආචාර ධර්ම යන මේ අංග හා ඒවායේ පැවැත්මට අවශ්‍ය දේ බුද්ධ ශාසනය නමින් හඳුන්වනු ඇත.**

(ආ) 9 වන වගන්තිය උල්ලංඝනය වන ආකාරයේ කිසිදු නීතියක් පැනවීම හෝ ක්‍රියාත්මක කිරීම ව්‍යවස්ථාවෙන් තහනම් කළ යුතුය

(ඇ) යම් පරිපාලන හෝ විධායක ක්‍රියාවක් මගින් හෝ යම් තැනැත්තෙකු විසින් කරනු ලබන ක්‍රියාවක් මගින් 9 වන වගන්තිය උල්ලංඝනය වන අවස්ථාවක එය අධිකරණය මගින් වලක්වාලීමට හා 9 වන වගන්තිය අධිකරණය මගින් එකී ක්‍රියාව කරනු ලබන තැනැත්තාට හෝ ආයතනයට එරෙහිව ක්‍රියාත්මක කර ගැනීමට අයිතිය සෑම පුරවැසියෙකුට ව්‍යවස්ථාව මගින් ලබා දිය යුතුය

(ඈ) 9 වන වගන්තිය මගින් අර්ථ ගන්වන බුද්ධ ශාසනය ශ්‍රී ලංකාව පුරා ස්ථාපිත කර තිබෙන වගට අනු ව්‍යවස්ථාවකින් ප්‍රකාශ කළ යුතුය

<u>මූලික අයිතිවාසිකම්</u>

මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට ජනතාවගේ හා පාලකයින්ගේ මූලික යුතුකම් හා වගවීම් ද ඇතුලත් කර ඒවා ක්‍රියාත්මක කරවා ගැනීමේ ක්‍රමවේදයක් ද පැනවිය යුතු ය.

සියලු ජනතාව <u>එකම නීතියකට</u> යටත් විය යුතු අතර ආගම හෝ වෙනත් ජාතිවාදි පදනමක් මත පදනම් වූ ප්‍රාදේශිය හෝ පුද්ගලික නීති සෑදීම ව්‍යවස්ථාවෙන් ම වැලක්විය යුතුය.

මූලික අයිතිවාසිකම් යන්නට (අ) සෘජු අයිතිවාසිකම හා (ආ) යුතුකම් පදනම් කරගත් අයිතිවාසිකම යනුවෙන් වර්ග දෙකක් යෝජනා කර සිටියි-

එම පරිච්ඡේදයට මෙහි පහත සඳහන් අයිතිවාසිකම් ද ඇතුලත් කරන ලෙස යෝජනා කර සිටියි.

(අ) ශ්‍රී ලංකාව විදේශ රටක් හෝ ආයතනයක් සමග ඇති කර ගැනීමට අපේක්ෂා කරන ජාත්‍යන්තර ගිවිසුම් හා ඒවායේ අන්තර්ගත කරුණු, ශ්‍රී ලංකාව අත්සන් තැබීමට අපේක්ෂා කර සිටින ජාත්‍යන්තර සම්මුති හා ප්‍රඥප්ති හා ඒවායේ අන්තර්ගත කරුණු, එම ගිවිසුම්වල හා සම්මුති ප්‍රවර්ධනය කරනු ලබන හෝ හඳුන්වා දෙනු ලබන අය පිළිබඳ සියලු තොරතුරු පූර්වයෙන් දැන ගැනීමට සෑම පුරවැසියෙකුට ම අයිතියක් තිබිය යුතු ය

(ආ) ශ්‍රී ලංකාවේ දේශ සීමාව තුල (එනම් භූමිය, සමුද්‍රය හා අහස) පිහිටි සියලු ස්වභාවික සම්පත්, සත්ව හා ශාක ගෝලය අයත් ස්වභාවික පරිසරය ආරක්ෂා කර ගැනීමේ අයිතියක් ද ඒවාට හානි කරනු ලබන හෝ අවභාවිතා කරනු ලබන අයකුට එරෙහිව නිතිමය ක්‍රියාමාර්ග ගැනිමට ද අයිතිය සෑම පුරවැසියෙකුට ම තිබිය යුතු ය

(ඇ) රජයක් විසින් ජනතාව වෙත ඉටු කිරිමට බැඳි සිටින ජාතික ප්‍රතිපත්ති හා මූලික යුතුකම් ඉටුකරවා ගැනිමට අයිතියක් සෑම පුරවැසියෙකුට ම තිබිය යුතු ය

(ඇ) සමාජයේ පොදු සෞඛ්‍ය තත්වයට හා ආරක්ෂාවට හානියක් නොවන පරිදි දේශිය වෛද්‍ය ක්‍රමයකින් ප්‍රතිකාර ගැනිමට ඇති අයිතිය

(ඊ) පුද්ගලයකු සම්බන්ධයෙන් සංචිත කරනු ලබන ජිව දත්ත හා පෞද්ගලික තොරතුරු විශ්ලේෂණය කිරිම සඳහා අදාල තැනැත්තාගේ කැමැත්ත නොලබා විදේශ රටකට සම්ප්‍රේෂණය කිරිම වලක්වාලිමේ අයිතිය

(උ) ශ්‍රී ලංකාවට ආවේනික වු ගස්වර්ග, ඖෂධ, ජිව විශේෂ ආදිය ද ශ්‍රී ලංකාවට අයත් පෞරාණික නිර්මාණ, දැනුම හා සම්පත් සම්බන්ධයෙන් විදේශ ආයතන හෝ පුද්ගලයින් විසින් අයිතිය කියා පෑම සම්බන්ධයෙන් එරෙහි විමට ඇති අයිතිය

**යුතුකම් පදනම් කරගත් අයිතිවාසිකම්**

(අ) සෑම රාජ්‍ය නිලධාරියෙකු ප්‍රතිපත්ති සම්පාදකයෙකු රාජ්‍ය නායකයෙකු හා පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු හෝ පළාත්පාලන ආයතනයක සභිකයෙකු විසින් ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු බවට නිතිය මගින් විධානය කර තිබෙන හෝ ජනතාව වෙත පොරොන්දු වී තිබෙන යුතුකම් හා වගකිම් අධිකරණය මගින් ඉටුකරවා ගැනිමේ අයිතිය

(විධායක හෝ පරිපාලන ක්‍රියාවකට සිමා නොවු සමාජ යුතුකම පදනම් කරගත් අයිතිවාසිකම)

(ආ) පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකු වෙනුවෙන් එම තැනැත්තා විසින් දරනු ලබන සමාජමය තත්වය ධුරය සේවය හෝ නිලය මත ඉටුකල යුතු යුතුකම් ඉටුකරවා ගැනිමෙ අයිතිය හා එසේ නොකිරිම මත වන්දි ලබා ගැනිමේ අයිතිය (එවැන්නක් ඉටු කිරිම පැහැර හැරිම වරදක් කළ හැකිය)

**භාෂාව**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව විය යුතු ය.

ශ්‍රී ලංකාව පුරා බලපැවැත්වෙන පරිපාලන භාෂාව සිංහල විය යුතු ය.

උතුරු හා නැගෙනහිර පළාත්වල පරිපාලන භාෂාව ලෙස දෙමළ භාෂාව ද භාවිත කල හැකිය

**රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවිමේ මුලධර්ම**

දැනට පනවා තිබෙන රාජ්‍ය ප්‍රතිපත්ති හා මුලධර්ම ඒ ආකාරයෙන් ම පැවතිය යුතුය. එහෙත් වත්මන් ව්‍යවස්ථාවේ ඇති එම පරිච්ජේදයට බලාත්මක භාවයක් නොමැති හෙයින් එහි අර්ථයක් නොමැත. එම

නිසා රාජ්‍ය ප්‍රතිපත්ති හා මූලධර්මවලට පහත සඳහන් ආකාරයෙන් බලාත්මක බාවයක් ලබා දීමට යෝජනා කර සිටියි.

(අ) ව්‍යවස්ථාදායකය විසින් පනවනු ලබන සෑම නීතියක් ම එම ප්‍රතිපත්ති හා මූලධර්ම වලට පටහැනි නොවිය යුතු අතර එම මූලධර්ම මත පදනම් විය යුතුය

(ආ) සෑම විධායක ක්‍රියාවක් ම එම මූලධර්ම වලට පටහැනි නොවිය යුතු අතර එම ප්‍රතිපත්ති හා මූලධර්ම සාක්ෂාත් කර ගැනීමට ගත කළ යුතු ය

(ඇ) එකී ප්‍රතිපත්ති හා මූලධර්ම වලින් තෝරාගත් විශේෂ ඒවා අධිකරණය මගින් විධායකය හරහා ක්‍රියාත්මක කරවා ගැනීමට පුරවැසියන්ට අයිතිය තිබිය යුතුය

## රාජ්‍ය සේවය

රාජ්‍ය සේවකයින්ට බලපාන නිශ්චිත හා පාරදෘශ්‍යභාවයෙන් යුත් පත්වීමේ මාරුකිරීමේ හා උසස්වීම් පටිපාටියකට අවශ්‍ය නීතිමය පදනම අන්තර්ගත කළ යුතුය

රාජ්‍ය සේවකයින්ට දේශපාලන මැදිහත් වීමකින් තොරව ස්වාධීනව රාජ්‍ය ප්‍රතිපත්ති හා මූලධර්ම ඉලක්ක කොටගෙන සේවය කිරීමට බලය හා හැකියාව ව්‍යවස්ථාවෙන් සහතික කළ යුතුය

බලය අවභාවිත කරනු ලබන, රාජ්‍ය දේපළවල හා ජාතික සම්පත්වල සුරක්ෂිත බාවයට හානිවන ආකාරයෙන් තීරණ ගනු ලබන හා දූෂිත ක්‍රියාවල යෙදෙන රාජ්‍ය සේවකයින් හඳුනා ගැනීමට හා ඔවුන්ට එරෙහිව දැඩි පියවර ගැනීමට විශේෂ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු අතර විගණාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කොට ඒ සඳහා විශේෂ බලාධිකාරියක් පිහිටුවීමට යෝජනා කර සිටියි.

එවැනි අයථා ලෙස ක්‍රියා කරන රාජ්‍ය සේවකයින්ට එරෙහිව පැමිණිලි කිරීමට පුරවැසියන්ට අයිතිය තිබිය යුතු අතර එවැනි පැමිණිලි ඉහත කී ආකාරයේ බලාධිකාරියක් වෙත සෘජුව ඉදිරිපත් කිරීමට හා එමගින් සහන ලබා ගැනීට හැකියාව තිබිය යුතුය.

රාජ්‍ය සේවකයින්ගේ අයථා ක්‍රියාවන් හා නොකර හැරීම් හේතුවෙන් අත්‍යෘජතියට පීඩාවට හා අගතියට පත් ජනතාවට සහන අප්‍රමාදව ලබා දීමේ යාන්ත්‍රණයක් පිහිටුවිය යුතුය.

## පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය

රටටම බලපාන පරිදි කිසිදු සීමාවකින් තොරව නීති සෑදීමේ බලය මධ්‍යම පාර්ලිමේන්තුව සතු විය යුතු ය.

ජනතා පරමාධිපත්‍ය බලයට හෝ ව්‍යවස්ථාවේ මූලික හරයට හානිවන කිසිදු නීතියක් පැනවීම තහනම් කළ යුතු අතර සීමා සහිත අවස්ථාවල දී පමණක් එවැන්නක් ජනමත විචාරණයකින් පමණක් සම්මත කළ හැකි විය යුතු ය.

නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වී වසරක් ඇතුලත ජාතික ආරක්ෂාව, විදේශ සම්බන්ධතා, ජාතික සම්පත්, අධ්‍යාපනය, සෞඛ්‍ය ආදි තෝරාගනු ලබන විෂයන් ට අදාලව ජාතික ප්‍රතිපත්තියක් ජනතා සහභාගිත්වය ඇතුව සකසා පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත යුතු අතර ඉන් මතු සම්මත වන සියලු නීතින් හා විධායක හා පරිපාලන ක්‍රියාකලාපයන් ව්‍යවස්ථාවේ ඇතුලත් කර තිබෙන ජාතික ප්‍රතිපත්ති හා මූලධර්මවලට අනුකූල විය යුතු ය.

එකී සියලූ ජාතික ප්‍රතිපත්ති මත සියලු රාජ්‍ය හා පෞද්ගලික අංශ ඒකාබද්ධ වන පරිදි සකස් කරන ලද ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද හා පද්ධති (protocols and systems) සීමා සහිත කාලය ක් ඇතුලත පාර්ලිමේන්තු ව විසින් හා/හෝ පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත්ව සකසා බලාත්මක කළ යුතු බවට අනිවාර්ය කළ යුතු ය.

යම් පනතක් සම්මත වූ පසුව ද එහි ව්‍යවස්ථානුකූල භාවය ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ හබ කිරීමේ අයිතිය ජනතාවට ලබා දිය යුතු ය.

**රටට ම බලපාන හා රට තුල එක හා සමානව ක්‍රියාත්මක වන එකම නීතියක් පමණක් තිබිය යුතුය.**

**පාර්ලිමේන්තුවේ මූල්‍ය බලය හා ජාත්‍යන්තර ගිවිසුම්**

රාජ්‍ය මූල්‍ය හා සම්බන්ධ සියලු පියවර ක්‍රියාත්මක කළ යුත්තේ ඒවා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූවායින් පසුව ය.

ජනතාවගේ **<u>ආර්ථික පරමාධිපත්‍ය</u>** (Economic Sovereignty) බලයට යටත් සියලු අංග සම්බන්ධයෙන් නීති පැනවීමේ බලය හා තිරණය කිරීමේ බලය පාර්ලිමේන්තුව සතු විය යුතු ය.

විසර්ජන කෙටුම්පතක් සම්මත වූවායින් පසුව එම පනත බලාත්මක වන කාලය තුල දී එහි අන්තර්ගත යම් කාරණයක් සම්බන්ධයෙන් වෙනසක් හෝ සංශෝධනයක් විය හැකි රෙගුලාසි, ගැසට් නිවේදන, චක්‍රලේඛ හෝ නියම පැනවීම ව්‍යවස්ථාව විසින් ම තහනම් කළ යුතුය.

පාර්ලිමේන්තුව විසින් සම්මත කළහොත් මිස කිසිදු ජාත්‍යන්තර වෙළඳ ගිවිසුමක් හෝ වෙනත් එවැනිම ආකාරයේ වූ ගිවිසුමක් වලංගු නොවිය යුතු ය. සියලූ ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් හා අනෙකුත් ගිවිසුම් අත්සන් තැබීම සඳහා පාර්ලිමේන්තුවේ පූර්ව අනුමැතිය ජනාධිපතිවරයා ඇතුලු විධායකය විසින් ලබා ගත යුතු ය.

සියලු ජාත්‍යන්තර ගිවිසුම් ඒවා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට පෙර ජනතාව වෙත හෙළිදරව් කළ යුතු අතර ජනතා පරමාධිපත්‍ය බලයට හා ජාතික ආරක්ෂවට හානිකර ගිවිසුම් අධිකරණයේ හබ කිරීමේ අයිතිය ජනතාවට ලබා දිය යුතු ය. එවැන්නකට බලාත්මක භාවය ලබා දීම ජනමතවිචාරණයකින් පමණක් සිදුවිය යුතු ය.

ජාත්‍යන්තර වෙළඳ, ආරක්ෂක හා වෙනත් ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ නිතිමය ක්‍රමවේදයක් හා එවැනි ජාත්‍යන්තර ගිවිසුම් වල බලපෑම හා විශය පථය පිළිබඳව දේශිය බුද්ධිමතුන්, විශේෂඥයින් හා පළපුරුදු තැනැත්තන් මගින් නිසි පූර්ව අනුමැතියක් ලබා ගැනීමෙන් පසු පාර්ලිමේන්තුව විසින් සම්මත කළ යුතු ය.

## ඡන්ද බලය සහ ජනමතවිචාරණය ඇතුළුව මැතිවරණය

මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභා වාර්තාවේ (2007-06-05) නිර්දේශවලට අනුව මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමට යෝජනා කර සිටි

ලියා පදිංචිය මත පුරවැසිභාවය ලබන තැනැත්තෙකුට ඡන්ද බලය ලැබීමට අවම වශයෙන් ශ්‍රී ලංකාව තුල වසර හතක කාලයක් පිවත්ව සිටිය යුතු ය

ඡන්ද බලය පාවිච්ච කළ හැකි විය යුත්තේ එම තැනැත්තා ලියා පදිංචි වී සිටින ඡන්ද කොට්ඨාශය තුලදී පමණක් විය යුතු ය

ඡන්ද බලය අහිමි වූ තැනැත්තෙකුට නැවත ඡන්දය දිමට සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් වසර 5 ක් වත් ඡන්ද නාම ලේඛනයේ ලියාපදිංචි ඡන්ද දායකයෙකු ලෙස සිටය යුතු ය

## බලය විමධ්‍යගත කිරීම/ බලය බෙදා හැරීම / බලය වෙන් කිරීම

පළාත් සභා බලතල විමධ්‍යගත කරනු ලබන ඒකකයක් නොවිය යුතුය

බලතල විමධ්‍යගත කිරීමේ මූලික ව්‍යුහය සකස් විය යුත්තේ ගම හෝ ආසනය පදනම් කරගෙන ය.

පාර්ලිමේන්තුව සමග හබ කිරීමට හැකියාව තිබෙන කිසිදු ව්‍යවස්ථාදායක බලය ඇති ආයතනයක් නොතිබිය යුතු ය.

## අධිකරණය

අධිකරණයේ ස්වාධීන බව තහවුරු කිරීම සඳහා සියලු අධිකරණවල විනිසුරුවරුන් පත් කිරීම හා උසස් කිරීම සඳහා ව්‍යවස්ථාවෙන් පිළිගත් පොදු නිර්ණායකයක් හා පටිපාටියක් තිබිය යුතුය.

අධිකරණයේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා අධිකරණවල සේවය කරන සියලු නිලධාරීන්ගේ හා විනිසුරුවරුන්ගේ සේවය සම්බන්ධයෙන් ප්‍රගතිය සමාලෝචනය කිරීමේ හා කාර්යසාධනය කිරීමේ ක්‍රමවේදයක් ව්‍යවස්ථාවෙන් තහවුරු කළ යුතුය.

නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් පරිච්ඡෙදයක් පැවතිය යුතු අතර එහි දී නීතිපති දෙපාර්තමේන්තුව ස්වාධීන හා අපක්ෂපාති ආයතනයක් ලෙසත් (රජයේ දූෂිත නිලධාරීන්ව ආරක්ෂා කිරීමේ ආයතනයක් ලෙස නොව) මහජන සුභසිද්ධිය පිණිස පමණක් ක්‍රියා කරන ආයතනයක් බවට ව්‍යවස්ථාවෙන් සහතික කළ යුතුය.

පොදු ජනතාවට තම වත්පොහොසත් කම නොතකා ඕනෑම අධිකරණයක පිහිට පැතිමට සම අවස්ථාවක් ලබා දීම සඳහා ව්‍යවස්ථාවෙන් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.

## වෙනත් විෂයන්

### ස්වභාවික හා ජාතික සම්පත්

ස්වභාවික සම්පත් හා ජාතික සමපත් වල පරම අයිතිය වත්මන් පුරවැසියන් හා අනාගත පරම්පරාවන් සතු විය යුතු අතර පවතින ආණ්ඩුව විසින් ඒවා **විශ්වසනීය භාරයක්** වශයෙන් පමණක් දැරිය යුතු ය.

දේශයේ භූමිය හා ස්වභාවික සම්පත් වල අයිතිය හෝ බුක්තිය කුමන හෝ මට්ටමකින් හෝ අන් රාජ්‍යයක සෘජු හෝ වක්‍ර පාලනයට නතු කර නොදිය යුතු අතර එම බලපෑම ඇති දැනටමත් ඇතුලත් වී තිබෙන සියලු ගිවිසුම් හෝ පැවරීම් පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයකින් අනුමත කරනු නොලැබුව හොත් අවලංගු වූවා ලෙස සැලකිය යුතු බවට ද පැනවිය යුතු ය.

ශ්‍රී ලංකාවේ දේශ සීමාව තුල (එනම් භූමිය, සමුද්‍රය හා අහස) පිහිටි සියලු ස්වභාවික සම්පත්, සත්ව හා ශාක ගෝලය අයත් ස්වභාවික පරිසරය ආරක්ෂා කර ගැනීමේ අයිතියක් ද ඒවාට හානි කරනු ලබන හෝ අවභාවිතා කරනු ලබන අයකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට **පරමාධිපත්‍ය අයිතිවාසිකමක්** සෑම පුරවැසියෙකුට ම තිබිය යුතු ය

## ද්විත්ව පුරවැසිභාවය

ද්විත්ව පුරවැසිභාවය අහෝසි කළ යුතුය- ඒ වෙනුවට ද්විතික පුරවැසි වැනි නව සංකල්පයක් හඳුන්වා දිය යුතුය

## වත්මන් ව්‍යවස්ථාවේ 4 හා 7 උපලේඛනවල සඳහන් දිවුරුම්/ප්‍රතිඥා

වත්මන් ව්‍යවස්ථාවේ 4 හා 7 උපලේඛනවල සඳහන් දිවුරුම්/ප්‍රතිඥා ලබා දීම වත්මන් ව්‍යවස්ථාවේ සඳහන් කාරණා සඳහා අදාල කර ගත යුතුය

එම දිවුරුම්/ප්‍රතිඥා වලට "**<u>දේශයට පක්ෂපාති වීම</u>**" ප්‍රතිඥාවේ කොටසක් ලෙස ඇතුලත් කරන ලෙස යෝජනා කෙරේ

සභාපති,

දේශය සුරැකීමේ ජාතික ව්‍යාපාරය,

ධර්මායතනය

අංක 381, බෞද්ධාලෝක මාවත,

කොළඹ 7

2020 දෙසැම්බර මස 28 වන දින දිය